ලංසු ආරාධනය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පවිත්‍රතා සේවාව සඳහා ලංසු කැඳවීම

01. කොළඹ 01 ලෝටස් පාරේ පිහිටි බිම් මහල ඇතුළුව මහල් 05 කින් සමන්විත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ පැරණි ගොඩනැගිල්ල හා පහළ බිම් මහල සහ ඉහළ බිම් මහල ඇතුලුව මහල් 07 කින් සමන්විත නව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ගොඩනැගිල්ල සඳහා පිරිසිදු කිරීමේ සේවාව 2025/2026 වර්ෂයන්හි වසරක කාල පරිච්ඡේදයක් (2025.09.01 දින සිට 2026.08.31 දින දක්වා) තුළ පවත්වාගෙන යාම සඳහා **ජාතික තරඟකාරී ලංසු කැඳවීම** යටතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන ලංසුකරුවන්ගෙන් පමණක් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2025.07.29 වැනි දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.
මේ සඳහා ඔබ විසින් සපුරාලිය යුතු මූලික සුදුසුකම් පහත පරිදි වේ.

(I) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබීම.

(II) රාජ්‍ය/සංස්ථා අංශයේ පිරිසිදු කිරීමේ සේවා සැපයීම සම්බන්ධව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද (අවම වශයෙන් එක් ආයතනයක හෝ සේවකයන් 30 ක් යොදවා තිබිය යුතුය.)

(III) අවම වශයෙන් කම්කරුවන් 100 කින් සමන්විත කම්කරු කණ්ඩායමක් සිටිය යුතු අතර යටත් පිරිසෙන් පසුගිය මාස 12 ඇතුළත ඔවුන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබූ බව සනාථ කරන ලියවිලි ඉදිරිපත් කළයුතුය.

(සැ.යු.:- ඉල්ලුම් පත්‍රය සමඟ ඉහත සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂි ලේඛන/සහතික වල සහතික කල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.)

02. ලංසු කැඳවීමේ ලේඛනයන්හි උපදෙස් ලබා දී ඇති පරිදි ලංසු බැඳුම්කරය හා අනෙකුත් ලියකියවිලි ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

03. මේ සඳහා ආපසු නොගෙවනු ලබන රු.3500.00 ක මුදලක් ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ලබා ගන්නාවූ රිසිට්පත සමග මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු 2025.07.14 දින සිට 2025.07.28 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා ඉහත ලිපිනයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ඉහල බිම් මහලේ පිහිටි ගිණුම් අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය. එමෙන්ම ඔබට ලංසු ලියවිලි පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහාද ඉහත දිනයන්හි දී එය නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

04. ලංසුකරු ස්වකීය ලංසුව සමඟ රු.300,000.00 ක ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරය / බැංකු ඇපකරයක් හෝ ඒ වටිනාකමට ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතු මුදල "මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්" නමින් තැන්පත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ සරප් කවුන්ටරය වෙත එම මුදල ගෙවීම් කර රිසිට් පතක් ලබා ගත යුතුවේ. ලංසු ඇපකරය ලංසු විවෘත කරන දින සිට ලිත් දින එකසිය විස්සක් (120) දක්වා (එනම් 2025.11.25 දින දක්වා) වලංගුව පැවතිය යුතුය.

05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන ලංසුභාර ගැනීමේ නියමිත වේලාව අවසන් වීමට පෙර ලැබෙන පරිදි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ නව ගොඩනැගිලේ ඉහළ බිම් මහලේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ 2025.07.29 දින ප.ව. 2.00ට පෙර ලැබෙන පරිදි ප්‍රධාන ගණකාධිකාරී, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ලෝටස් පාර, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ හැකිය. මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ වමපස ඉහළ කෙළවරෙහි "මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පිරිසිදු කිරීමේ සේවා සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කළ යුතුය.

06. පූර්ව ලංසු සාකච්ඡාවක් 2025.07.21 දින පෙ.ව.10.30 ට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ දී පැවැත්වේ.

07. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, එනම් 2025.07.29 දින ප.ව.2.00 ට භාණ්ඩාගාර නව ගොඩනැගිලේ ඉහළ බිම් මහලේ ගිණුම් අංශයේ පැවැත්වීමට නියමිත ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පමණක් සහභාගි විය හැක.

08. ලංසු කැඳවීමේ ලියකියවිලි පිළිබඳ තවදුරටත් විස්තර අවශ්‍ය නම් ගණකාධිකාරී (සැපයුම්)011-2484538 /011-2484600 (Ext. 1430 / 4109) වෙතින් ලබාගත හැක.

සභාපති, අමාත්‍යාංශ සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01